**ශීර්ෂය 268 - කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය - 268 කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 23 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 298.30 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 293.79 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.51 ක් හෙවත් සියයට 1.51 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 190.30 | 187.39 | 2.91 | 1.53 |
| මූලධන | 108.00 | 106.40 | 1.60 | 1.48 |
| **එකතුව** | **298.30** | **293.79** | **4.51** | **1.51** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 19 ක් හා දෙපාර්තමේන්තු 11 ක් විසින් එකතුව රු.මිලියන 1,993.20 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,936.70 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 56.50 ක් හෙවත් සියයට 2.83 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 10.50 | 10.43 | 8.50 | 12.47 | 42.00 | 35.66 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ තැන්පත් ගිණුම් 06 ක 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 37,125,771 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0002/0116/000 | 5,000 |
| 6000/0000/00/0013/0076/000 | 216,523 |
| 6000/0000/00/0016/0064/000 | 21,793,206 |
| 6000/0000/00/0017/0019/000 | 2,301,030 |
| 6000/0000/00/0018/0076/000 | 108,355 |
| 6003/0000/00/0020/0010/000 | 12,701,657 |
| **එකතුව** | **37,125,771** |

## 2.4 විගණන නිරීක්ෂණය

-----------------------

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

## 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

----------------------

පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 3.2 විසර්ජන ගිණුම

--------------------

### 3.2.1 අයවැය විචලනය

--------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තු තත්කාර්ය අන්දමින් පිළියෙල කර තිබීම හේතුකොටගෙන ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක සහ පුනරාවර්ථන වැය විෂයයන් 03 ක ඇති වී තිබූ ඉතිරිවීම් රු.713,934 ක් සඳහා ලබාදී තිබූ පැහැදිලි කිරීම් විගණනයේදී පිළිගත නොහැකි වී තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 7002/0000/00/0286/0016/000 දරන අග්‍රිම ගිණුමේ පැවති එකතුව රු.48,919,365 ක වැය නොකළ ශේෂය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අදාල අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය නොකර නිරවුල් කර තිබුණි.

(ආ) අදාල කර්මාන්තයන් අවසන් නොවූ නමුත්, කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙනුවෙන් ලියන ලද රු.13,757,468 ක් වටිනා චෙක්පත් 03 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මහා

භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර 2017 ඔක්තෝම්බර් 31 දින වන විටත් මාස 10 කට අධික කාලයක් නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් වශයෙන් ගිණුම්වල පෙන්වා තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 26801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.610,595 ක හිඟහිටි ණය ශේෂ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව ඔවුන්ගෙන් අයකර ගැනීමට වර්ෂ 04 සිට 05 ක කාලයක් දක්වා කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.5 අනුකූල නොවීම්

### මුදල් රෙගුලාසිවලට අනුකූල නොවීම

වී මිලදී ගැනීමේ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization Advance) වශයෙන් එකතුව රු.7,050,000 ක් සමූපකාර සමිතිවලට ගෙවා තිබූ අතර වර්ෂ 02 සිට 04 කට අධික කාලයක සිට පවතින මෙම අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරික්ෂාවේදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අභ්‍යන්තරිකව අවතැන්වූ පවුල් සහ සරණාගතයින් සඳහා ජීවනෝපාය සහාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හඳුන්වාදීමේදී අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය. මේ හේතුකොටගෙන එවකට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අංක MR 4/31 දරන 2016 පෙබරවාරි 09 දිනැති ලිපියෙහි වූ කොන්දේසි අනුව ප්‍රතිලාභීන් අතරේ ගවයින් සහ එළුවන් බෙදා හැරීම වෙනුවට රු.40,052,000 ක මුදලක් ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට 2016 දෙසැම්බර් 31 දින මාරුකර තිබුණි.

## 3.7 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 8 වැනි පැකේජය (මායිම් තාප්ප, ළිං හැරීම, බෝක්කු ආදිය ඉදිකිරීම) ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කළ ප්‍රසම්පාදනයට පටහැනිව දෙවැනි අවම ලංසුව ඉදිරිපත් කල ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 01 වැනි පැකේජය (ගෙබිම සැකසීම, ප්‍රජා මධ්‍යස්ථාන, ළිං හැරීම් ආදි ඉදිකිරීම් ) ඇගයීමට ලක් කිරීමේදී ලංසු පෝරමයේ ( bid form) සියයට 10 ක මිල වට්ටම් කිරීමක් සඳහන් කර තිබුණද, ඒ පිළිබඳ සැලකිල්ල යොමු නොකර ඉදිරිපත් කර තිබූ මිල වෙනස් කිරීම සැලකිල්ලට ගෙන තිබුණි. මේ හේතුවෙන් රජයට රු.318,930 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) ඉහත සඳහන් ලංසු මුල් හා දෙවන පිටපත් වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කර තිබුණත් ලංසුවලට අදාල සියළුම අනු පිටපත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6 වැනි මාර්ගෝපදේශයේ 3.4 (අ) වගන්තියට පටහැනිව, මුල් ලංසු පිටපත්වලට සමගාමීව විවෘත කර තිබුණි.

(ඈ) කොන්ත්‍රාත්වල සත්‍ය වටිනාකම පිළිබඳව සැලකිලිමත් නොවී කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතු කල අගය මත බදු (VAT) ගෙවීම සඳහා 2016 අගෝස්තු 10 දින මහා භාණ්ඩාගාරයෙන් රු.1,258,578 ක අමතර ප්‍රතිපාදන, විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය සහ ග්‍රාමීය යටිතල සංවර්ධන වැඩසටහන් යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ වැඩසටහන් සඳහා ඉල්ලීම් කර ඇත. ඒ හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින රු.2,681,111 ක ඉතිරියක් ඇති වී තිබුණි. මේ අතරතුර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමකින් තොරව මෙම ඉතිරිය උපයෝගී කර ගනිමින් ඉදිකිරීම් කර්මාන්ත 07 ක් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.8 වැඩියෙන් ගෙවීම්

කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද බිල්පත් අනුව එකතුව රු. 1,013,549 ක වැඩ අවසන් නොවූ විවිධ කොන්ත්‍රාත් සඳහා වැඩියෙන් ගෙවීම් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| කොන්ත්‍රාත්තුවේ නම | බිල්පත් අනුව කළ වැඩ වටිනාකම | තථ්‍ය වශයෙන් කළ වැඩ අනුව වටිනාකම | වැඩියෙන් ගෙවීම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| තිරුනගර් උතුර පාර කොන්ක්‍රීට් දැමීමේ කර්මාන්තය | 6,912,810 | 6,380,746 | 532,064 |
| සෝරන්පත්තු මධ්‍යම පාර ඉදිකිරීමේ කර්මාන්තය | 6,434,468 | 6,280,040 | 154,428 |
| කනගාපුරම් පෙර පාසලේ මායිම් තාප්පය ඉදිකිරීම | 390,712 | 306,419 | 84,293 |
| විවේකානන්දනගර්හි පොදු ශාලාවේ (Common Hall) මායිම් තාප්පය ඉදිකිරීම | 192,569 | 152,156 | 40,413 |

| | | | |
|---|---|---|---|
| කන්නගිරම් හි පොදු ශාලාව (Common Hall) ඉදිකිරීම | 320,362 | 269,040 | 51,322 |
| උට්ටුප්පුලම් (Uttuppulam) හි පොදු ශාලාව ඉදිකිරීම | 73,920 | 58,559 | 15,361 |
| තිරුවෙයියාරුහි මායිම් තාප්පය ඉදිකිරීම | 401,518 | 323,686 | 77,832 |
| පුදුමුරිප්පුහි මායිම් තාප්පය සහ පොදු ශාලාව ඉදිකිරීම | 140,540 | 106,869 | 33,671 |
| අක්කරයන්කුලම්හි පොදු ශාලාව ඉදිකිරීම | 360,760 | 336,595 | 24,165 |
| **එකතුව** | **15,227,659** | **14,214,110** | **1,013,549** |

## 3.9 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ පෙන්වා තිබූ එකතුව රු. 72,841,466 ක පාඩු සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ග වර්ෂ 08 කට අධික කාලයක සිට ගෙන නොතිබුණි.

(ආ) රාජකාරී වාහන 05 කට සිදුවූ අලාභ තක්සේරු කර විසර්ජන ගිණුම්වලට 2011 වර්ෂයේ සිට ගෙන නොතිබුණි. තවද, වර්ෂ 04 කට පෙර වාහනයකට සිදුවූ රු.1,047,800 ක අලාභය විසර්ජන ගිණුමට ගෙන නොතිබුණි.

## 3.10 විසඳා නොතිබුණු විගණන ජේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව 2014 අප්‍රේල් 08 දින පැවති 197 වැනි රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණවල පසු විපරම් කටයුතු නිමකර නොතිබුණු ජේදවලට යොමුව පහත දැක්වේ.

| කාරක සභා රැස්වීම් තීරණවලට යොමුව | | යොමුගත විෂය |
|---|---|---|
| **වර්ෂය** | **ජේද අංකය** | |
| 2014 | 10 (iv) | වී මිලදී ගැනීම සඳහා සමුපකාර සමිති 4 කට ලබාදුන් රු.7,050,000 ක අත්තිකාරම් මුදල් නිරවුල් නොකිරීම පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග වර්ෂ 3 කට අධික කාලයක සිට නොගෙන ප්‍රමාද කිරීම. |

**3.11** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**-------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 13 | 10 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 04 | - | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 78 | 74 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 28 | 23 | 05 |
| | | **123** | **107** | **16** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පුරප්පාඩු 16 ක් පිරවීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙන නොතිබුණි.